# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## ගෝලීය සත්කාරක අධ්‍යාපනයේ දේශීය සන්නාමය හොබවන

## අපගේ විශිෂ්ට සාමාජිකයකු වන්න

## 1. අධ්‍යක්ෂ - මුදල් (HM 1-1 කාණ්ඩය) - කොළඹ

පහත සඳහන් කර්තව්‍යන් මනා ලෙස ඉටු කළ හැකි සුදුසුකම්ලත් අයදුම්කරුවන් හට විවෘත වේ.

- අයවැය සහ වියදම් පාලනය, ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති සහ ඒ හා සම්බන්ධ ක්‍රියාපටිපාටි පාලනය කිරීම.
- මුදල් ප්‍රවාහය කළමනාකරණය, ණය සුපරීක්ෂණය, අයකැමි කාර්යයන්, ආදායම් විගණනය, පිරිවැය, සමුද්‍ර හෝටලයේ සහ ආයතනයේ සියලුම ගිණුම් අධීක්ෂණය කිරීම.
- ආයතනයේ මූල්‍ය පුරෝකථනය හා විශ්ලේෂණ සඳහා වගකීම් දැරිය හැකි වීම.
- කළමනාකරණ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවට සහය වීම සඳහා අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා විශේෂයෙන් පවරා ඇති කළමනාකරණ කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මුදල්/ ගණකාධිකරණය/ වාණිජ්‍ය / මුදල් කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් **සමග**

   මුදල්/ ගණකාධිකරණය/ වාණිජ්‍ය / මුදල් කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (ICASL/ CIMA/ ACCA) සාමාජිකත්වය හෝ අදාළ වෘත්තීය ආයතනයක වෙනත් ඕනෑම සමාන සුදුසුකමක් **සහ**

   රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. වෘත්තීය වරලත් ආයතනයක (ICASL/ CIMA/ ACCA) පූර්ණ සාමාජිකත්වය හෝ අදාළ වෘත්තීය ආයතනයක වෙනත් ඕනෑම සමාන සුදුසුකමක් **සමග**

   රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 )**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ මධ්‍යම කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**ප්‍රතිලාභ** : වැටුප් පරිමාණය : HM 1-1–2016 රු:(80,295 – 10 x1,375–15x2, 270 – 114,345)

**ආරම්භක පියවර** : රු.80,295 + ජීවන වියදම් දීමනාව +අදාළ මාසික දීමනා, ප්‍රසාද දීමනා සහ කාර්යය සාධනය මත පදනම්ව දිරි දීමනා, වෘත්තීය දීමනා, වාහන/ ඉන්ධන දීමනා, රජයේ අනුමත නීති හා රෙගුලාසි අනුකූලව ගෙවනු ලැබේ.

## 2. සහකාර අධ්‍යක්ෂ - නඩත්තු (MM1-2 කාණ්ඩය) - කොළඹ

පහත සඳහන් කර්තව්‍යන් මනා ලෙස ඉටු කළ හැකි සුදුසුකම්ලත් අයදුම්කරුවන් හට විවෘත වේ.

- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සහ සමුද්‍ර හෝටලයේ සියලුම ඉදිකිරීම් හා නඩත්තු කාර්යයන් සඳහා වගවීම.
- විදුලිය, ජලය, දුරකථන, රූපවාහිනී සහ අනෙකුත් කාර්යාල හා වෙනත් උපකරණ සැපයීම ඇතුළු සියලුම සේවාවන් හි ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය සඳහා සහය වීම.
- වායුසමීකරණ, ජලනල පද්ධතිය හා සියලුම නඩත්තු සේවා නිසියාකාරව පවත්වා ගැනීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඉංජිනේරු විද්‍යාව (සිවිල්,විදුලි ක්ෂේත්‍ර) පිළිබඳ උපාධියක් **සහ**

සිවිල් ඉංජිනේරු හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍ර පිළිබඳ රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ලබාගත් කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත1 හෝ 2)**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර (JM) මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**ප්‍රතිලාභ** : වැටුප් පරිමාණය : MM 1-2 - 2016 රු:[54,550/- 10 x 1,375- 15 x 1910 - 96,950/-]

ආරම්භක වැටුප් පියවර : රු. 54,550/- + ජීවන වියදම් දීමනාව + අදාළ මාසික දීමනා, ප්‍රසාද දීමනා සහ කාර්යසාධන මත පදනම්ව දිරි දීමනා.

## 3. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2 කාණ්ඩය) - ඇබෑර්තු 05 (කොළඹ හා කුරුණෑගල)

පහත සඳහන් කර්තව්‍යන් මනා ලෙස ඉටු කළ හැකි සුදුසුකම්ලත් අයදුම්කරුවන් හට විවෘත වේ.

- අදාළ අංශයේ සියලුම ලිපි කටයුතු සඳහා වගකීමෙන් කටයුතු කිරීම.
- විෂය කරුණු නිසියාකාර පවත්වා ගැනීම සහ අදාළ ලිපි ගනුදෙනු සඳහා වගකීමෙන් කටයුතු කිරීම.
- වාර්තා තැබීම.
- ඕනෑම විටක හෝ අවශ්‍ය වූ විටෙක සියලුම පරිපාලන රෙගුලාසි හා මූල්‍ය රෙගුලාසි භාවිතා කළ හැකි දැනුමක් සහිත වීම.
- කාර්යාල උපකරණ (ෆැක්ස්, ස්කැනර්, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය) මෙහෙයවීම / ක්‍රියාකරවීම .

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය

ඇතුළු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක්වරකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා/පෙ) විභාගය සමත්වීම. **සහ**

අ.පො.ස. (උ /පෙ) විභාගය (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සුදුසුකම් සහිත ප්‍රාථමික මට්ටම (පුහුණු), ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) සහ ප්‍රාථමික මට්ටම (නුපුහුණු) ප්‍රභේදයන් හි සේවකයින් හට අයදුම්කළ හැකි වේ.

- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය

ඇතුළු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස.(සා/පෙ) විභාගය සමත්වීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**ප්‍රතිලාභ** :

**වැටුප් පරිමාණය** : MA 1-2- 2016 රු:( 27,910 – 10 x 300- 7 x 350- 12 x600-12 x700- 49,080/-)

**ආරම්භක වැටුප් පියවර** : රු.27,910/- + ජීවන වියදම් දීමනාව + අදාළ මාසික දීමනා, ප්‍රසාද දීමනා සහ කාර්ය සාධන මත පදනම්ව දිරි දීමනා.

**වෙනත් තොරතුරු :**

01. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල (EPF හා ETF ) සඳහා දායකත්වය
    - අ.) සේවක අර්ථසාධක අරමුදලට සේවකයා විසින් ඒකාබද්ධ වැටුපෙන් 10% බැගින්ද, සේව්‍යයා විසින් 15% කින්ද දායක වනු ඇත.
    - ආ.) සේවක භාරකාර අරමුදලට සේව්‍යයා විසින් වැටුපෙන් 3% කින් දායක වනු ඇත.
02. සේවකයා හා ඔහුගේ / ඇයගේ පවුල සඳහා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ආවරණයක් හිමිවේ.
03. ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.
04. පැයක් ඇතුළත අදාළ සේවා ස්ථානය වෙත ළඟා විය හැකි, උසස් පරිගණක සාක්ෂරතාවය සහිත, ද්වි භාෂා හැකියාව (සිංහල/ ඉංග්‍රීසි) සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

**සෑම අයදුම්කරුවකුම:**

- අ. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- ආ. තනතුරේ රාජකාරී මැනවින් ඉටුකිරීම සඳහා කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- ඇ. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
- ඈ. විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය :**

සම්පූර්ණ ජීවදත්ත විස්තර සහිත අයදුම්පත්, අධ්‍යාපනික සුදුසුකම්, සේවා පළපුරුද්ද ආදියට අදාළ සියලුම සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්ද සහිතව ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට 2024.04.26 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

සැලකිය යුතුයි: යම් අයදුම්කරුවෙකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අසම්පූර්ණ, ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත්වන අයදුම්පත් හා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**
**නො. 78, ගාලු පාර, කොළඹ 03.**

**සාමාන්‍ය විමසීම්** : 011 - 2208300 දිගුව 372/303
**වැඩි විස්තර සඳහා** : www.slithm.edu.lk